## "විශ්‍රාමයට පෙර සූදානමයි - සාර්ථක වැඩිහිටි දිවියයි" තේමාව යටතේ විශ්‍රාම පූර්ව වැඩසටහන පැවැත්වීම සම්බන්ධව උපදෙස් මාලාව.

රාජ්‍ය, අර්ධ රාජ්‍ය, පුද්ගලික අංශයේ රැකියාවල නිරතවන පුද්ගලයන් විශ්‍රාම ගැනීමත් සමඟ ඔවුන් මුහුණ දෙන ගැටළුකාරීත්වය අවම කිරීමත්, යහපත් ලෙස සමාජ ගත කිරීමට සහ වැඩිහිටිවිය සාර්ථක කරගැනීමට මඟ පෙන්වීමත් අරමුණු කර ගනිමින් මෙම වැඩසටහන දියත් කරනු ලබයි.

<u>ආයතනයක් තෝරා ගැනීම.</u>

1. දිස්ත්‍රික්කය තුළ ඇති රාජ්‍ය, අර්ධ රාජ්‍ය හෝ පුද්ගලික අංශයේ සුදුසු ආයතනයක් හෝ ආයතන කිහිපයක් මේ සඳහා තෝරාගත යුතුය.
2. ඔබ විසින් තෝරාගත් ආයතනයේ හෝ ආයතන කිහිපයක සේවය කරන වයස අවුරුදු 50 ට වැඩි විශ්‍රාම ගැනීමට ආසන්න නිලධාරින් 100 දෙනෙකු මෙම වැඩසටහන සඳහා සහභාගි කරවිය යුතුය.
3. වැඩසටහන සඳහා රු .115,000.00 ක මුදලක් ඔබ දිස්ත්‍රික්කය වෙත ලබා දෙනු ලබයි.
4. මෙම වැඩසටහනේ සම්බන්ධීකරණ කටයුතු දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල සේවය කරන වැඩිහිටි හිමිකම් ප්‍රවර්ධන නිලධාරි මඟින් සිදු කළ යුතු අතර, එම නිලධාරීන් නොමැති දිස්ත්‍රික් ලේකම් කාර්යාල සඳහා සමාජසේවා නිලධාරි / සංවර්ධන නිලධාරි විසින් සිදු කළ යුතු වේ.
5. වැඩසටහන 2024.06.30 වන දිනට ප්‍රථම පවත්වා අවසන් කළ යුතුය.
6. වැඩසටහන පැවැත්විය යුතු අවම කාලය පැය හයක් විය යුතුය.
7. වැඩසටහන පහත සඳහන් මාතෘකාවලට අනුව සිදුකළ යුතුය.

| අනු අංකය | මාතෘකාව | අරමුණ |
|---|---|---|
| 01 | විශ්‍රාම දිවියේ ශාරිරික හා මානසික සුවය | විශ්‍රාම ගතවන පුද්ගලයන්ගේ සෞඛ්‍ය යහපත් කර ගැනීමට මඟ පෙන්වීම |
| 02 | විශ්‍රාම වැටුප්, ETF හා EPF ලබා ගැනීමට පුද්ගලික ලිපිගොනුව කෙසේ විය යුතුද? | දිගු කලක් සේවයේ නිරත වෙමින් සිටින නිලධාරීන්ගේ පුද්ගලික ලිපිගොනුව සකසා ගැනීමට මඟ පෙන්වීම. |
| 03 | සැලසුම් සහගත වැඩිහිටි වියක් | විශ්‍රාම ගතවන වැඩිහිටියන් යහපත් ලෙස සමාජ ගත කිරීමටත් වැඩිහිටි විය සාර්ථක කරගැනීමටත් මඟ පෙන්වීම. |

8. මෙම වැඩසටහන සඳහා සම්පත් දායකයින් තෝරා ගැනිමේදී හා දීමනා ගෙවීමේදී රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ චක්‍රලේඛ අනුව සිදු කළ යුතුය.
9. වැඩසටහන පැවැත්වීමට අදාළ මූල්‍ය ප්‍රතිපාදන දිස්ත්‍රික් ලේකම් කාර්යාල වෙත ලබා දෙනු ලැබේ.
10. මුදල් ලැබීම් කුවිතාන්සි පත (පොදු 172) මුදල් ලැබී දින 14 ක් ඇතුළත ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය වෙත එවිය යුතුය.
11. වැඩසටහන පවත්වා අවසන් වූ වහාම ඒ සම්බන්ධව දිස්ත්‍රික් ලේකම්ගේ අනුමැතිය සහිත සවිස්තර වාර්තාව NSE/DEV/FO/ 002/I (ඇමුණුම 01) ආකෘතියට අනුව 2024.07.15 දිනට ප්‍රථම ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය වෙත ඉදිරිපත් කළ යුතුය.